ඌවපරණගම ප්‍රාදේශීය සභාව

බදුල්ල දිස්ත්‍රික්කය

-----------------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 06 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී උපලබ්ධි කල රු.6,000,000 ක ස්ථාවර තැන්පතු වර්ෂයේ ආදායමට බැර කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,848,935 ක් වටිනා කර්මාන්ත 03 ක් වෙනුවෙන් මුදල් ගෙවා තිබියදී එම වටිනාකම කර්මාන්ත ණය හිමියන් තුළ ඇතුලත් කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සභාවේ දැනට භෞතිකව නොපවතින රු.5,470,180 ක කුට්ටි ගල් තොගයක් සමාලෝචිත වර්ෂයේ අවසන් තොගයට ඇතුළත් කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.34,961,413 ක් ලෙස හඳුනාගෙන තිබුණද,එය අවසන් ගිණුමට ඇතුළත් කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.362,626 ක් වූ ණයගැති ශේෂය විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | විගණනයට අදාල වන සාක්ෂි ගිණුම් සමඟ ඉදිරිපත් කළයුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂයේදි නියමිත සාක්ෂි ඇතුළත් කර ගිණුම් සකස් කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) 150 වගන්තිය | සභා සීමාවේ පවතින කර්මාන්ත / ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත බදු අයකර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |
| (ii) 126 (vii)(ඊ) හා අංක 2049 දරන 2017 දෙසැම්බර් මස 08 දිනැති ගැසට්පත්‍රය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සවි කර ඇති දැන්වීම් පුවරු සම්බන්ධයෙන් පරික්ෂාවන් සිදුකර විස්තර ලේඛනගත කර ගාස්තු අය කර නොතිබුණි. | පනත හා ගැසට් පත්‍රය අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |
| (ආ) 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන)රීති සංග්‍රහය රීති 114 | සමාලෝචිත වර්ෂයෙ දෙසැම්බර් 31 දිනට රු.280,765 ක අත්තිකාරම් පියවා නොතිබුණි. | 1988 ප්‍රාදේශිය සභා රීති අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරි මුල්‍ය වර්ෂයේදී අතුරු අග්‍රිමය පියවීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,487,110 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,967,366 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,519,540 | 2,910,964 | 2,242,372 | 668,592 | 2,269,540 | 2,812,020 | 2,674,918 | 756,897 |
| (ii) | කුළී | 1,289,000 | 1,293,844 | 938,913 | 354,931 | 1,451,000 | 873,832 | 929,649 | 503,278 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 965,000 | - | | - | 700,000 | 40,000 | 980,280 | |
| (iv) | වෙනත් ආදායම් | 9,800,000 | 9,907,318 | 3,254,805 | 6,652,513 | 11,584,000 | - | 6,592,877 | 5,301,710 |
| | එකතුව | 14,573,540 | 14,112,126 | 6,436,090 | 7,676,036 | 16,004,540 | 3,725,852 | 11,177,724 | 6,561,885 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.14,112,126 ක මුළු ආදායමෙන් වර්ෂය අවසාන වන විට රු7,676,036 ක් අයකර නොතිබුණු අතර, එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 54 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | 2019 වර්ෂයේදී සියළු හිඟ ආදායම් අයකර අවසන් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු කඩකුලී,ජල ගාස්තු,පොල බදු සහ හිඟහිටි ප්‍රාග්ධන ආධාර රු.19,436,272 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි . |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂයේ බිල් කරන ලද රු.9,907,318 ක් වූ වෙනත් ආදායමින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.6,652,513 ක් රැස්කර නොතිබුණු අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 67 ක් විය. | හිඟ වෙනත් ආදායම් අයකර ගත යුතුවේ. | 2019 වර්ෂයේදී හිඟහිට ඇති වෙනත් ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ උසාවි දඩ රු.21,310,525 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ මුදල් අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ අයකිරීමට කටයුතු කරමි. |

(ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ මුද්දර ගාස්තුව රු.5,751,596 ක් අයකර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පැහැදිලිව හඳුනා ගෙන හා ඒවා මැනීම සඳහා දර්ශකද හඳුනාගෙන ඉදිරියේදී කටයුතු කරමි. |

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරන බව. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් කැබ් රථයකට අදාල වාහන ආදායම් බලපත්‍රය කල්පසු වී ලබාගැනීම හේතුවෙන් 2018 වර්ෂය තුළදී ආදායම් බලපත්‍රය ලබාගැනීමේදී රු.32,670 ක දඩ මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. | නියමිත දිනවලදී ආදායම් බලපත්‍ර ලබාගත යුතුවේ. | අදාල දඩ මුදල් ගෙවීම විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි සිදුකරන බව දන්වමි. |
| (ආ) | වසර කට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු සැපයුම් ණයහිමි කර්මාන්ත ණයහිමි, වෙනත් ණයහිමි එකතුව රු.22,915,994 ක් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | මුදල් ප්‍රතිපාදන ලැබුණු වහාම එම ගෙවිය යුතු දෑ නිදහස් කිරීමට කටයුතු කරමි. |

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 03 කට අදාල අතිරික්ත කාර්ය මණ්ඩලය 14 ක් විය. | අනුමත කරගෙන නොමැති කාර්ය මණ්ඩලයේ තනතුරු අනුමත කර ගත යුතුවේ. | අතිරික්ත තනතුරු අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට වාර්තා ඉදිරිපත් කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 02 කට අදාලව පුරප්පාඩු 02 ක් පැවතුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවිය යුතුවේ. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කරමි. |

3.4 <u>ප්‍රසම්පාදනය</u>

<u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරමි. |

4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>අභ්‍යන්තර විගණනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | සෑම වර්ෂයක් සඳහාම අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | පිළිතුරු ලැබී නොමැත. |

4.2 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/ 2009 (01) දරන චක්‍රලේඛය අනුව කාර්තුවකට එක් වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද,සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක බැගින් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | ඉදිරියේදී කාර්තුවකට එක බැගින් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |